# ACCOUNTING RECORDS FOR ISSUING SHARES

"
–

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

# කොටස් නිකුත් කිරීම හා ප්‍රතිෂ්ඨාව ලබා ගැනීම

## සමාගමක කොටස් නිකුත් කිරීම සිදු කළ හැකි අවස්ථා

1. මූලික ප්‍රසිද්ධ නිකුතුවක් මගින්,
2. පරිණාත ප්‍රසිද්ධ කොටස් නිකුතුවක් මගින්

කොටසක මිල හෙවත් ප්‍රතිෂ්ඨාව එකවර හෝ වාරික වශයෙන් ලබා ගත හැකි වේ.

**(වාරික වශයෙන් ලබා ගැනීම අ.පො.ස. උ/පෙළට අදාළ නොවේ).**

ClassLK

# එකවර මුදල් ලබා ගැනීමට අදාළ ජර්නල් සටහන්

1. මුදල් ගිණුම (හර) xx

   කොටස් නිකුත් කිරීමේ ගිණුම (බැර) xx

   (අයදුම් මුදල් ලබා ගැනීම)

2. කොටස් නිකුත් කිරීමේ ගිණුම (හර) xx

   ප්‍රකාශිත කොටස් ප්‍රාග්ධන ගිණුම (බැර) xx

   (කොටස් විභජනය කිරීම )

සමාගමක නිකුත් කරන ලද කොටස් ප්‍රමාණයකට වඩා වැඩියෙන් අයදුම්පත් ලද විටෙක වැඩිපුර ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කර, එම මුදල් ආපසු යැවීම සිදු කළ යුතු ය.

වැඩිපුර ලද අයදුම්පත් කිසියම් අනුපාතයකට හෝ අනුපාත කිහිපයක් පදනම් කර ගනිමින් කොටස් පවරා දීම සිදු කළ හැකි ය.

ClassWork.LK

මෙය සමානුපාතික විභජනය ලෙස හැඳින්වේ. මෙහි දී ද වැඩිපුර ලද මුදල් ආපසු යැවිය යුතුයි.

එනම්,

| | | | |
|---|---|---|---|
| කොටස් නිකුත් කිරීමේ ගිණුම | (හර) | xx | |
| මුදල් ගිණුම | (බැර) | | xx |

ClassWork.LK

## අභ්‍යාසය - 01

කොටසක ප්‍රතිෂ්ඨාව සම්බන්ධව ඔබ ලබා ගත් දැනුම ආශ්‍රයෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| කොටසක ප්‍රතිෂ්ඨාව යන්න හැඳින්වීම | කොටසක් ප්‍රතිෂ්ඨාව තීරණය කිරීම සිදු කරන පාර්ශ්ව | කොටසක ප්‍රතිෂ්ඨාව වෙනුවෙන් ලබා ගන්නා දේවල් | කොටසක ප්‍රතිෂ්ඨාව ලබා ගන්නා ආකාරය |
|---|---|---|---|
| | | | |

ClassWork.LK

# අභ්‍යාසය - 02

සීමිත ජනුලි සමාගමේ විස්තර පහත දී ඇත.

1. 2012.01.01 දින සීමිත ජනුලි සමාගම රු. 40 සාමාන්‍ය කොටස් 100 000ක් මහජනයා වෙත නිකුත් කළේ ය. අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසන් දින 2018.01.31 වේ. 2018.01.31 වන විට කොටස් 120000කට මුදල් ලැබී තිබිණි.

2. සමාගම වැඩිපුර ලද මුදල් 2018.02.05 දින කොටස් හිමියන්ට ආපසු යැවී ය. පසුව ඉතිරි මුදල් ප්‍රාග්ධනිත කරන ලදි.

ClassWork.LK

ඉහත ගනුදෙනුවලින් පැන නගින තත්වයන් පහත දැක්වෙන ලෙස ගිණුම්වල වාර්තා කරන්න.

**<u>සීමිත ජනුලි සමාගම</u>**

මුදල් ගිණුම

කොටස් නිකුත් කිරීමේ ගිණුම

ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධන ගිණුම

ClassWork.LK

## අභ්‍යාසය - 02

2018.01.01 දින සීමාසහිත ,අරුණාලු , සමාගම රු. 50 සාමාන්‍ය කොටස් 100 000ක් අයදුම් පත්‍ර සමඟ මුළු මුදල් ලබා ගැනීම සඳහා මහජනයා වෙත නිකුත් කළේ ය. අයදුම් පත්‍ර භාර ගැනීම 2018.01.31 දින අවසන් විය. එදින වන විට කොටස් 250 000 ක් සඳහා මුදල් ලැබී තිබිණි.

අවශ්‍ය වන්නේ,

ඉහත සිද්ධිය උපයෝගි කර ගෙන පහත ප්‍රශ්නවලට අදාළ පිළිතුරු සපයන්න.

(අ)

I. අයදුම්පත්‍ර සමග ලද මුළු මුදල කීය ද?
II. ප්‍රතික්ෂේප කළ අයදුම් මුදල් කොපමණ ද?
III. ප්‍රාග්ධනිත කළ වටිනාකම කොපමණ ද? / විභජනය කළ කොටස්වල වටිනාකම කොපමණ ද?

ClassWork.LK

(ආ)

මුදල් ගිණුමට සියලු අයදුම් මුදල් ලැබුණි නම් ගනුදෙනු සටහන් කිරීමට අවශ්‍ය ජර්නල් සටහන් (මුදල් සමග) දක්වන්න.

I. ------------------------------------------------ හර

------------------------------------------------ බැර

( )

II. ------------------------------------------------ හර

------------------------------------------------ බැර

( )

III. ------------------------------------------------ හර

------------------------------------------------ බැර

( )

ClassWork.LK

# අභ්‍යාසය - 03

සීමිත ලෝචන සමාගම 2018.01.01 දින රු. 60ක් බැගින් වූ කොටස් ප්‍රමාණයක් එකවර මුදල් ලබා ගැනීමට නිකුත් කළේ ය. කොටස් නිකුතුවට අදාළ තොරතුරු පහත දැක්වේ.

| විස්තර \ කොටස්කරුවෝ | පැරණි කොටස්කරුවෝ | ජනයා | දේශීය ව්‍යාපාරිකයෝ වෙනත් පුද්ගලයෝ | විදේශිකයෝ | මුළු එකතුව |
|---|---|---|---|---|---|
| අයදුම් කළ කොටස් ගණන | 50 000 | 200 000 | 300 000 | 50 000 | ......... |
| විභජනය කළ කොටස් ගණන | ............. | ............ | 100 000 | ........... | ......... |
| විභජන අනුපාතය | 1:1 | 2:1 | ........... | 5:1 | ......... |

ClassWork.LK

**අවශ්‍ය වන්නේ :**

i. අයදුම්පත්‍ර සමග ලද මුළු මුදල වාර්තා කිරීමේ ජර්නල් සටහන

---------------------------------------------------- හර

---------------------------------------------------- බැර

( )

ii. ආපසු යැවූ මුදල වාර්තා කිරීමේ ජර්නල් සටහන

---------------------------------------------------- හර

---------------------------------------------------- බැර

( )

iii. ප්‍රාග්ධනිත කිරීමට අදාළ ජර්නල් සටහන

---------------------------------------------------- හර

---------------------------------------------------- බැර

( )

iv. සේවකයකු වූ දිනිදු ලද කොටස් ගණන 5 000කි. ඔහු අයදුම්පත්‍ර සමග එවූ මුදල කීය ද?

ClassWork.LK

v. දේශීය ව්‍යාපාරිකයකු ලද මුළු කොටස් ගණන 3000 කි. ඔහුට ආපසු යැවූ මුදල කීය ද?

## <u>අභ්‍යාසය - 04</u>

1. කොටසක ප්‍රතිෂ්ඨාව යන්න විස්තර කරන්න
2. කොටසක ප්‍රතිෂ්ඨාව ලබා ගන්නා ක්‍රම ඉදිරිපත් කරන්න.
3. කොටසක ප්‍රතිෂ්ඨාව එකවර ලබා ගැනීමට අදාළ ජර්නල් සටහන් තබන්න.
4. කොටසක ප්‍රතිෂ්ඨාව එකවර ලබා ගැනීම ලෙජර් ගිණුම්වලට පිටපත් කරන්න.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura